## රුහුණ විශ්වවිද්‍යාලය

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව රුහුණ විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට රුහුණ විශ්විද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ .

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

##### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

විශේෂ අත්තිකාරම්, මුදල් හා මුදල් සමාන දෑ, වියදම් නොවූ ප්‍රාග්ධන ආධාර හා ත්‍යාග හා පරිත්‍යාග යන ගිණුම් විෂයයන්ට අදාල හර හා බැර ශේෂයන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 03 ට අනුකූල වන පරිදි වෙන වෙනම දැක්වීම වෙනුවට ශුද්ධ ශේෂය පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ හේතුවෙන් එකී වත්කම් හා වගකීම්වල නියම ස්වරූපය මූල්‍ය ප්‍රකාශන වලින් නිරූපනය වී නොතිබුණි.

##### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වසර ගණනාවකට පෙර ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කර, මුළු ගෙවීම් ද කර තිබූ කර්මාන්තයන්හි රු. 3,282,636 ක් වූ වටිනාකම ප්‍රාග්ධනීත නොකර වියදම් නොවූ ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

##### 1.2.3 නොපියවූ ගිණුම්

පුස්තකාල පොත් හා වාර සඟරා අත්තිකාරම් ගිණුමේ ශේෂය 2004-2008 වර්ෂ වලට අදාලව රු. 311,738 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි.

### 1.2.4 නොසැසදුණු ගිණුම්

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව ව්‍යාපෘති 11ක , තැන්පතු ගිණුමක හා අත්තිකාරම් ගිණුම් ශේෂ අතර හා ඊට අදාල උපයෝගී පොත් අනුව ශේෂ අතර රු. 529,668 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව කොතලාවල ආරක්ෂක පීඨ අරමුදලේ හා එක්ස්ප්ලෝරා ක්ලබ් යන ගිණුම්වල ආරම්භක ශේෂ හා ඊට අදාල උපයෝගී ලේඛන අනුව ආරම්භක ශේෂ අතර රු. 530,227 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.5 නීති ,රීති ,රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි (මු.රෙ) | |
| මු .රෙ 155 | 2007 සිට 2011 මාර්තු 31 දක්වා නිකුත් කර තිබූ විගණන විමසුම් 52 ක් සඳහා පිළිතුරු එවා නොතිබුණි. |
| මු .රෙ 387 | රාජ්‍ය ආයතන විසින් බැංකු අයිරා ගැනීම සපුරා තහනම්කර තිබියදී ඊට පටහැනිව විශ්වවිද්‍යාලය විසින් ජංගම ගිණුම් 2 ක් සඳහා අයිරා පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් 2010 වර්ෂයේ රු.1,349,397 ක් අයිරා පොලී ගෙවා තිබුණි. |
| (ආ) 1971 අංක 08 දරණ සංශෝධිත සේවක අර්ථ සාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරණ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | ප්‍රධාන කාර්යාලය, කෘෂි විද්‍යා පීඨය හා ඉංජිනේරු පීඨය තුළ සේවය කරන ස්ථිර නොවුන කාර්යමණ්ඩලයේ සේවකයන් 13 දෙනකු වෙනුවෙන් රු.496,337 ක් වූ දායක මුදල සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තකයන්ගේ භාර අරමුදලට ගෙවා නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු වලින් සදු වී ඇති ඌනතාවය රු. 1,336,931,276 ක් වූ අතර පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණ රු. 1,125,281,929 ක ප්‍රදානය හේතු කොටගෙන ඌනතාවය රු.211,649,347 ක් දක්වා අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයේ රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර ඌනතාවය රු. 1,270,667,601 ක් වු අතර එම වර්ෂයෙ පුනරාවර්තන වියදම් සඳහා වු රු.1,039,178,650 ක රජයේ ප්‍රදානය හේතු කොට ගෙන එම ඌනතාවය රු.231,488,951 දක්වා අඩු වී තිබුණි.

### 2.2 අධ්‍යයන කටයුතු

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සම්බන්ධ වැදගත් දත්ත පහත දැක්වේ.

| පවත්වා තිබූ උපාධි පාඨමාලා | පාඨමාලා සංඛ්‍යාව | වර්ෂය තුළ උපාධි පරීක්ෂණයට පෙනී සිටි සංඛ්‍යාව | වර්ෂය තුළ බිහි වූ උපාධිධාරීන් සංඛ්‍යාව | අසමත් / ඌණ සාමාර්ථ ලද සිසුන් සංඛ්‍යාව | වර්ෂය තුළ බඳවා ගත් නවක සිසුන් සංඛ්‍යාව | වර්ෂය අවසානයට සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව | වර්ෂය සඳහා වූ ඒක ශිෂ්‍ය පිරිවැය (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ශාස්ත්‍රවේදී | 13 | 471 | 348 | 123 | 438 | 1,589 | 74,748 |
| ව්‍යාපාර පරිපාලනවේදී | 01 | 293 | 241 | 52 | 325 | 1,553 | 23,396 |
| විද්‍යාවේදී | 08 | 296 | - | - | 303 | 951 | 140,581 |
| කෘෂිකර්ම විද්‍යාවේදී | 01 | 122 | 95 | 27 | 131 | 623 | 143,553 |
| වෛද්‍යවේදී | 01 | 179 | 165 | 14 | 194 | 795 | 91,402 |
| ඉංජිනේරු විද්‍යාවේදී | 03 | 134 | 108 | 26 | 245 | 1,096 | 158,134 |
| ධීවර හා සාගර විද්‍යා | 01 | 34 | විභාගය සම්පූර්ණ වී නොමැත | | 45 | 151 | 160,248 |
| | 28 | 1,453 | - | - | 1,681 | 6,758 | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(අ) විද්‍යා පීඨයේ 2010 වර්ෂයේ පවත්වන ලද විභාග ප්‍රතිඵල 2011 මාර්තු 31 වන තුරු නිකුත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සියළුම පීඨයන්හි අවසාන උපාධි පරීක්ෂණයන්ට පෙනී සිටි සිසුන්ගෙන් 18.45% ක් උපාධි පරීක්ෂණය අසමත් වී තිබූ අතර එහි වැඩිම ප්‍රතිශතයක් මානව ශාස්ත්‍ර පීඨයට අදාල වී තිබුණි. එය 26.12% ක් විය. කෘෂි පීඨයේ සිසුන්ගෙන් 22.13 % ක් අසමත් වී හෝ ඌණ සාමාර්ථ ලබා තිබුණි.

## 2.3 <u>අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල කළමනාකරණය</u>

සමාලෝචිත වර්ෂය තුල විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| පීඨය | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය - අධ්‍යයන හා අධ්‍යයන සහායක (ස්ථිර) | අධ්‍යයන කාර්යය මණ්ඩලය - බාහිර | අනධ්‍යයන කාර්ය මණ්ඩලය | ගුරු සිසු අනුපාතය |
|---|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 1,589 | 82 | 23 | 40 | 19 |
| කළමනාකරණ හා මුල්‍ය පීඨය | 1,553 | 42 | 08 | 13 | 37 |
| විද්‍යා පීඨය | 951 | 64 | 17 | - | 15 |
| ධීවර හා සාගර විද්‍යා තාකෂණ පීඨය | 151 | 15 | 14 | 12 | 10 |
| කෘෂි පීඨය | 623 | 66 | 28 | 115 | 09 |
| වෛද්‍ය පීඨය | 1,096 | 97 | 100 | 91 | 11 |
| ඉංජිනේරු පීඨය | 795 | 53 | 19 | 101 | 15 |
| මුල්‍ය හා පරිපාලන ඒකකය | - | - | - | 812 | - |
| එකතුව | 6,758 | 419 | 209 | 1,184 | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

පීඨ සඳහා අනුයුක්ත ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය පමණක් සැලකිල්ලට ගත් විට මානව ශාස්ත්‍ර,විද්‍යා, ධීවර හා සාගර විද්‍යා, කෘෂි විද්‍යා,වෛද්‍ය සහ ඉංජිනේරු යන පීඨයන්හි එක් ආචාර්යවරයෙකු වෙනුවෙන් සිටි සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 19,15,10,09,11 සහ 15ක් විය. එසේ වුවද, කළමනාකරණ හා මූල්‍ය පීඨයේ එම සංඛ්‍යාව පිළිවෙලින් 37 ක් වී තිබුණි. ඒ අනුව 1:20 ක් වූ විශ්වවිද්‍යාල සම්මත , සාමාන්‍ය ආචාර්ය ශිෂ්‍ය අනුපාතය කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පවත්වා ගෙන ගොස් නොතිබුණි.

## 2.4 අරමුදල් ඌණ උපයෝජනය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ විභාග ශාලා ගොඩනැගිල්ල හා එලියකන්ද පිරිමි නේවාසිකාගාරය වෙනුවෙන් පිළිවෙලින් ලැබී තිබූ අරමුදල් රු. 1,442,775 ක් හා රු. 7,563,344 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වැය කර නොතිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

(අ) අධ්‍යයන නිවාඩු ලබා ගෙන විදේශ ගත වූ ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු රු.15,631,102ක මුදල අයකර ගැනීමට පාලනාධිකාරීන් විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් වෙනුවෙන් වැටුප් රහිත අධ්‍යයන නිවාඩු අනුමත කිරීමට පෙර ඔවුන් ගෙන් අය වීමට තිබූ රු.1,891,560 ක් වූ ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පර්යේෂණ අත්තිකාරම් ලිත් වර්ෂය ඇතුලත දී පියවිය යුතු වුවත්, එසේ කිරීමට කටයුතු කර නොතිබුණු මුදල රු. 359,659 ක් විය. මෙම මුදල තුළ, වර්ෂ 10 ක් ඉක්මවූ රු. 55,000 ක පර්යේෂණ අත්තිකාරම් මුදලක්ද ඇතුලත් වී තිබුණි.

## 2.6 ක්‍රියාත්මක නොවූ පර්යේෂණ ව්‍යාපෘති

විවිධ පීඨවල පර්යේෂණ ව්‍යාපෘතීන් 14 ක් සඳහා ඉකුත් වර්ෂවල සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතුව රු. 1,362,673 ක මුදලක් ලැබී තිබුණ ද එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හැර දමා තිබුණි.

## 2.7 නිෂ්කාර්ය හා ඌන උපයෝජන වත්කම්

රු.810,000 ක් වැය කර 2010 ජුනි මස මිළ දී ගත් ත්‍රීරෝද රථ 2 ක 2011 පෙබරවාරි මස වන විටත් ධාවනයට යොදා ගෙන නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ අනාවරණය වූ දුර්වලතා වරින් වර විගණන විමසුම් මගින් විශ්ව විද්‍යාලයේ අවධානයට යොමුකරන ලද අතර, පහත සඳහන් පාලන කේෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) අධ්‍යයන නිවාඩු ලබා දීම.

(ආ) වාහන පාලනය.

(ඇ) මිලදී ගැනීම.

(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අරමුදල් උපයෝජනය.

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය.